ස.සේ.කො.චක්‍රලේඛ අංක 01 /2022

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2022.01.27

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල
ගරු සභාපති /සාමාන්‍යාධිකාරී/කළමනාකරු,

## සමුපකාර සේවකයින් සඳහා 2022 වර්ෂයේ නිවාඩු

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. ඒ අනුව 2022 වර්ෂය සඳහා පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | | |
|---|---|---|---|
| 01. ජනවාරි | 14 | සිකුරාදා | - දෙමළ තෛපොංගල් දිනය |
| 02. පෙබරවාරි | 04 | සිකුරාදා | - නිදහස් සමරු දිනය |
| 03. අප්‍රේල් | 13 | බදාදා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 04. අප්‍රේල් | 14 | බ්‍රහස්පතින්දා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 05. මැයි | 01 | ඉරිදා | - ලෝක කම්කරු දිනය |
| 06. මැයි | 15 | ඉරිදා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 07. මැයි | 16 | සඳුදා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 08. ඔක්තෝබර් | 09 | ඉරිදා | - ( මිලා - දුන් - නබි) නබි නායක තුමාගේ උපන් දිනය |
| 09. දෙසැම්බර් | 25 | ඉරිදා | - නත්තල් උත්සව දිනය |

02. ඉහතින් දැක්වූ විධි විධාන වලට අතිරේකව සේවකයින් අතරින්,
* හින්දු භක්තිකයකුට දීපවාලී දිනය ද,
* මුස්ලිම් භක්තිකයකුට රාමසාන් උත්සවය හා හජ්ජි උත්සවය පැවැත්වෙන දිනය ද,
* ක්‍රිස්තු භක්තිකයකුට මහ සිකුරාදා සහ පාස්කු ඉරිදා වශයෙන් හැඳින්වෙන දිනය ද,

සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු වශයෙන් දිය හැකිය.

03.පසළොස්වක පොහොය දිනය වැටුප් සහිත නිවාඩු දිනයක් ලෙස සැලකිය යුතුය. පෝය නිවාඩු දිනයක් සති නිවාඩු දිනකට හෝ ප්‍රසිද්ධ නිවාඩු දිනයකට වැටුනහොත් ඒ සඳහා අතිරේක නිවාඩුවක් හිමි නොවේ. තවද, සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් සමුපකාරිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි "රජයේ නිවාඩු" දිනයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින්ට නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළ හොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳව තීරණය කළ හැකිය.

04. උක්ත දිනයන් නිවාඩු දින වශයෙන් යොදාගෙන ඇති බැවින්, පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතිය කැමැත්තේ නම් "සමිති කාර්යාල හෝ බැංකු හෝ ප්‍රාදේශිකයන් හෝ ව්‍යාපාරික අංශ" මෙම දින වල විවෘ තැබීමටත්, එම දින වල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැ එසේ ක්‍රියා කරනු ලැබූ විට දී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදා ගත් දි ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී නිවාඩු ලබා දි යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, ව්‍යාපාරික ස්ථානයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙ දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත්, නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙ වාර්තා කළ යුතුය.

05. ඉහත දැක් වූ නිවාඩු දිනවලින් කිසිවක් සමිතියේ සතිපතා ලැබෙන නිවාඩු 1 ½ තුළට ඇතුලත් වුවහොත් වෙනුවෙන් පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලත සේවකයින්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්ප වශයෙන් දෙපක්ෂයේ එකඟතාවය ඇතිව ඒ වෙනු දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම කළ හැකි වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

පිටපත්- :  - කා. දැ.පි.

1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්(වයඹ පළාත) - දැ.ගැ.පි - අ.කා.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.කා.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.කා.ස.